# කොළඹ පාරිභෝගික මිල දර්ශකය

## ජූලි මස දළ විශ්ලේෂණය


2024 ජූලි 31

පදනම 2021 = 100


**194.7**

අද දින ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2024 ජූලි මාසය සඳහා 2021=100 දර්ශක යොමු කාලයට ගණනය කළ කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො..පා.මි.ද.) සහ කොළඹ නාගරික ප්‍රදේශය සඳහා මාසික පාරිභෝගික උද්ධමනය ප්‍රකාශයට පත් කරනු ලබයි.

**කො.පා.මි.ද., 2024 ජුනි මාසයට සාපේක්ෂව 2024 ජූලි මාසයේ උද්ධමනයේ කැපී පෙනෙන වෙනස්කම්**




**උද්ධමනය (කොළඹ නාගරික) 2.4%**



කො.පා.මි.ද. (පදනම 2021=100): බර තැබීම් %
ආහාර: **26.2%** ආහාර නොවන: **73.8%**

**කො.පා.මි.ද., මතුපිට (ජූලි 2024)**

ලක්ෂ්‍යමය උද්ධමනය **2.4%**

ආහාර කාණ්ඩය සඳහා ලක්ෂ්‍යමය උද්ධමනය: **1.5%**

ආහාර නොවන කාණ්ඩය සඳහා ලක්ෂ්‍යමය උද්ධමනය: **2.8%**

මාසික වෙනස: **-0.5%**

**කො.පා.මි.ද., යටිදැරි* (ජූලි 2024)**


* නිතර මිල වෙනස්වන ආහාර, බලශක්ති හා ප්‍රවාහන වියදම් ඉවත් කළ පසු

ලක්ෂ්‍යමය උද්ධමනය: **4.4%** මාසික වෙනස: **0.3%**

ලක්ෂ්‍යමය උද්ධමනය **(2.4%) සඳහා ආහාර සහ ආහාර නොවන කාණ්ඩයන්හී දායකත්වය**

ආහාර: **0.5%** ආහාර නොවන: **1.9%**

**කො.පා.මි.දර්ශකය (පදනම:2021=100) මතුපිට, ආහාර, ආහාර නොවන සහ උද්ධමන අනුපාතයන්ගේ විචලනය**




**මාසයට අදාළ විශේෂිත කරුණු**

- 2024 ජුනි මාසය සඳහා 195.6ක් වූ කො.පා.මි.ද. (මතුපිට) (පදනම:2021=100), 2024 ජූලි මාසයේදී 194.7ක් දක්වා අඩු වී ඇත.
- මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩය මගින් 0.03% ක හා ආහාර නොවන කාණ්ඩය මගින් -0.47%ක දායකත්වයක් ලැබී ඇත.
- 2024 ජුනි මාසයේදී 177.4ක් වූ කො.පා.මි.ද.(යටිදැරි) (පදනම:2021=100), 2024 ජූලි මාසයේදී 177.9 දක්වා වැඩි වී ඇත.
- දර්ශක යොමු කාලයට (2021) සාපේක්ෂව පොදු මිල මට්ටමෙහි වැඩිවීම 94.7% කි.

2024 අගෝස්තු මාසය සඳහා කොළඹ පාරිභෝගික මිල දර්ශකය 2024.08.30 දින ප.ව. 3.00ට නිකුත් කරනු ලැබේ.

**මිල හා වේතන අංශය, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**
**මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය - ශ්‍රී ලංකාව.**

**වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර අපගේ වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.**

*http://www.statistics.gov.lk/InflationAndPrices/StaticalInformation/MonthlyCCPI*